# නිපුණධම්ම දේශනා

# 04



## අළුයම හමුවූ දෙව්ලිය

# පටුන


| | |
|---|---|
| පටුන | 3 |
| උණුවතුර ගංගාවක්....... | 5 |
| දෙවඟනගේ පෙලඹවීම. | 8 |
| අපි සරණ යන්නේ කුමන දහමක්ද....... | 9 |
| ස්වාක්ඛාත වූ අමා දහම....... | 10 |
| සන්දිට්ඨික වෙයි සදහම්........ | 11 |
| අකාලික දහම් ගඟ..... | 12 |
| ඒහිපස්සිකකෝ කියල කියන්නේ... | 12 |
| ඕපනයික කියල කියන්නේ ... | 13 |
| පච්චත්තංවෙදිතබ්බො විඤ්ඤූහී ගුණ හිමි ණුවණැත්තන්ගේ දහම..... | 13 |

# සමිද්ධි සූත්‍රය ඇසුරින් කරන ලද දහම් ගුණ කෙටියෙන්.....

තරුණ කාලේ සෑම දෙනාම ලස්සනට ඉන්න හරිම කැමතියි. නමුත් උපතින්ම ලස්සන රූපයක් ලැබෙන්නේ කලාතුරකින් කෙනෙකුට . එවැනි රූපයක් ලැබෙන්නට පිං කරල තියෙන්න ඕන. එවැනි රුවක් දෙස කාගේත් සිත් ඇදී යනවා. ඒකත් පිනේම විපාකයක්. නිතර ඒ අයට අනුන්ගේ උපකාර ලැබෙනවා. ඒකත් පිනේ විපාකයක්. ඒකට ධර්මයේ කියන්නේ උපධි සම්පත්තිය කියල. මෙවැනි අවස්ථා වල මේවා නුරුස්සන අය සිටිනවා. ඒ අය පිනැත්තිට පිනැත්තාට බනින්නේ පොත්ත සුදු නිසා ආදී නින්දිත වචන වලින්. ඒ අය තව තවත් අවලස්සන වෙන්න කරුනු එකතු කර ගන්නවා. නමුත් සමහර විට බලන අයට රාගී සිතුවිලිද උපදිනවා. ඒක බලන ආකාරය අනුවයි බලන කෙනා අනුවයි තමයි. ඒක රුව හිමි කෙනාගේ වැරුද්දක් නොව රුව දෙස බලන කෙනාගේ වැරැද්දකි......

**ඉතින් මෙවැනි ලස්සන රූපයක් තියන කෙනෙක් ස්ත්‍රීයක් හෝ වේවා පුරුෂයෙක් හෝ වේවා තරුණ කාලයේම පැවිදි බිමට ආවොත් බොහෝ දෙනෙක් බලන්නේ වැරදි විදිහට. සමහරු හිතන්නේ මේ අය ගිහිගේ අතහැරියේ කාම සැප සම්පත් නොලැබුන නිසා කියල හිතලා..**

ඒවා ලබාදෙන්න පුදුම කැමැත්තක් දක්වනවා. ඒක අද විතරක් නෙවෙයි බුදුරජාණන් වහන්සේ ඉන්න කාලෙත් තිබුනා. සමහරු මේ උපායන්ට අහුවෙලා සසරට නැවත බැදෙනවා. බොහෝ දෙනෙක් එහෙම නම්ම ගන්න අමාරුයි.

බුදුරජාණන් වහන්සේගේ කාලයේ ලස්සන හාමුදුරු කෙනෙකුට පෙම් බැන්ද දෙව්ලියකගේ කථාවයි මේ.....

## උණුවතුර ගංගාවක්.......

ඒ කාලයේ තථාගතයාණන් වහන්සේ වැඩසිටියේ රජගහ නුවර තපෝදාරාමයේ. තපොදා කියන්නේ උණුවතුර ගංගාවක්. ලංකාවෙත් උණුවතුර ලිං තියෙනවා ඔබ දන්නවා ඇතිනේද? අන්න ඒ වගේ එක තැනකින් උඩට ඇවිල්ලා ගංහාවක් වගේ ගලාගෙන යනවා. මේ ආරාමයේම වැඩසිටියා ඉතාම තරුන ලස්සනම ලස්සන භික්ෂුවක්. ලඟදී තමයි පැවිදි වෙලා තිබුනේ. නමින් හඳුන්වන්නේ සමිද්ධි කියලා.

ඉතින් මේ සමිද්ධි හාමුදුරුවෝ එදා පාන්දර අරුණ ණැගෙන්නටත් පෙර අර ගංගාවට ගියා. ඇග සෝදාගෙන සරීරය වේලාගැනීම සඳහා අඳන සිවුර පමනක් ඇඳගෙන ගං ඉවුරේ වැලි තලාවට වෙලා සිටියා. ඒ වෙලාවේ එතනට දෙවඟනක් පැමිනුනා. මෙ වෙඟනට මේ තෙරුන්ගේ සරීරය දැකලා මෙච්චර ලස්සන සරීරයක් තිබ්ටදී ඇයි මේ භික්ෂුව පැවිදි වෙලා ඉන්නෙ කියල ප්‍රශ්නයක් ඇතිවුනා. අද කාලේ මිනිසුන් අතරත් එහෙමයිනේ.

කෙනෙකුට පැවිදිවෙන්න පුළුවන් වෙන්නේ සංසාරයේ එයා දාන පාරමිතාව බොහෝ කොට සම්පූර්ණ කරල තියෙන නිසා. නෙක්කම්ම පාරමිතාවත් පුරුදු කරගෙන යන නිසා. නමුත් තරුණ කාලයේ පැවිදි උනොත් දකින අයට හරි ප්‍රශ්නයක්.

මමත් පැවිදි උනේ අවුරුදු 25න් නිසා මමත් ඒක හරියට අත් විදල තියෙනවා. භාවනා කරල ගිහිගෙදර ඒකට භාධක නිසා අතහැරල දාන්න හිතුනා කීවට කවුරුත් පිළිගන්නේ නෑ. ඒ අයට තියෙන ප්‍රශ්න දෝ මන්දා අපේ පිට පටවලා අහනවා. සමහර විට එවැනි දේවල් අපි දන්නේවත් නෑ. නෑ කිවුවට පිලිගන්නේ නෑ. බොරු කියන්නේ කියල චොදනා කරල පවු පුරවා ගන්නවා. ඒක නිසා සමහර කෙනෙක් ගාව අපිට නිබ්ඟබ්ධ වෙන්න සිදුවෙනවා. කථාව වෙන පැත්තකට ගියා නමුත් වැදගත් නිසා කිවුවේ. ඇත්තටම මහන වෙන්නේ ප්‍රශ්න වලින් මිදෙන්න තමයි. හැබැයි ඒ මේ ජීවිතේ ඒවා නෙවෙයි. සංසාරගත ප්‍රශ්නයට .

කෑමවේල නිසා පැවිදි වෙච්ච අය බුදුරජාණන් වහන්සේගේ කාලයේත් හිටියා. නමුත් ඒ අය අන්තිමට රහත් උනා. ඒක නිසා කුමක් නිසා පැවිදි උනත් කරන්නේ නිවන් මග ගමන් කිරීමනම් වෙන කාරනා අදාල නෑ.

ඉතින් මේ දෙවඟන කිසිම ගරුසරුවක් නැතිව අහසේ ඉඳගෙනම ප්‍රශ්නයක් අහනවා ගාථාවකින්. ඉතින් ඒ ගාථාවත් ලස්සන නිසා මම පාලියෙනුත් ලියන්නම්.

**අභුත්වා භික්ඛසි භික්ඛු  න හි භුත්වාන භික්ඛසි**
**භුත්වාන භික්ඛු භික්ඛස්සු.  මා තං කාලෝ උපච්චගාතී....**

**භික්ෂුව ඇයි වලදන්නැතිව පිඬුසිගා යන්නේ....**
**වලදලා ඉවරවෙලා පිඬුසිඟා නොයන්නේ ඇයි...**
**වලදලා ඉවරවෙලා පිඬුසිඟා යන්න....**
**නැතිනම් ඔබට වළදන්න තියෙන කාලය නැතිවේවි...**

කෑම බීම ගැනනම් කථාවක් නෙමෙයි මේ.  වළදන්නෙ නැතිව පිඬුසිඟා යනවා කියන්නේ. පංචකාම සම්පත්තීන් ගෙදර ඉදන් විදින්නෙ නැතිව මේ මහන වෙලා ඉන්නේ මොකද කියන එකයි. ඊලඟට අහන්නේ රැකීරක්ෂා කරල අඹුදරුවන් සමග ගෙදර ඉදල වයසටගියහම පැවිදි වෙන්නෙ නැත්තෙ ඇයි කියල.

මේ කම් සැප විදලා අවසානයේ මහන වෙන්න. නැතිනම් කාමයන් විදින්න තියෙන මේ තරුන කාලය නැතිවෙලා යාවි.

කියල මේ ගෙදර යන්න කියල තමයි කියන්නේ. අද කාලෙත් මෙහෙම චරිත ඕනෑතරම් තියෙනවානේ. කවරුහරි යහපත් දෙයක් කරන්න හදනකොට පහලට ඇදල දාන්නමනෙ හදන්නේ

මේ වෙලාවේ සමිද්ධි හාමුදුරුවෝ කියනවා.

දෙවඟන... කාලය කියන්නෙ මොකද්ද කියල මම දන්නේ නෑ.

කාලය වැහිල තියෙන්නෙ මට පේන්නෙ නෑ
ඒකනිසා මම අනුභව කරන්නේ නැතිව පිඬුසිඟා යනවා. මාව කාලය විසින් විනාශ නොකරත්වා කියල හිතල..

කාලය දන්නේ නෑ කියන්නේ. මෙපමන කාලයක් සෙල්ලම් කරන්න ඕන මෙච්චර කාලයක් ඉගන ගන්න ඕන මෙච්චර කාලයක් අඹු දරුවන් සමග ඉන්න ඕන කියල බෙදල දක්වන්න බෑ. අන්න ඒක නිසා තමයි කාලය දන්නනෙ නෑ කියල කිවුවෙ. මොකද කෙනෙක් මෙපමන කාලයක් නියත වශයෙන් ජීවත් වෙනවා කියලා කියන්න පුළුවන් නම් එහෙම බෙදීමක් කරන්න පුළුවන් . නමුත් මේ ජීවිතය අනාත්ම එකක්.

කාලය වැහිල තියෙන්නේ ...
ඒ කියන්නේ අපි මැරෙන මොහොත කවුරුවත් දන්නේ නෑ.
කෙනෙක් කුඩාම කාලයේ උනත් මැරෙන්න පුළුවන් . තරුණ කාලයේ මැදි වයසේ මහලු වෙලා .... මේ ඕනෑම කාලයක මැරෙන්න පුළුවන් .. සමහරු ඉන්නවා මුදල් ඉතුරුකරන් මැරෙන්න තරම් ලෙඩකදී වියදන් කරනවා කියලා අවශ්‍ය තැන් වලදී පවා දුකසේ ඉවසගෙන. සමහර විට ඒකෙනා මැරෙන්නේ උනක් හෙම්බිරිස්සාවක් හැදිල. අර මුදල් අතහැරල නොහිතපු විදිහට මැරිල යනවා. බලන්න කාලය වැහිල තියෙන්නේ කාටවත් පේන්නේ නෑ. කොච්චර ලස්සනයි ද ඒ කියමන කියලා.

ඒකනිසා මම අනුභව කරන්නේ නැතිව පිඬුසිඟා වඩින්නේ ....
අන්න ඒ වැසුනු කාලය විසින් කොයි මොහොතක හෝ තමාව මරණයට රැගෙන යාහැකි බැවින්, දහම් මාවත ගැන දැනගත් මොහොතේ පටන් මා කාමයන් අතහැරල නිවන් මාර්ගයේ ගමන් කරනවා.  පැවිදිවෙලා පිරිසිදු ගමනක් යනවා කියලා උන්වහන්සේ ඒදෙවඟනට පිළිතුරු දුන්නා..

ඊළඟට ඒ දෙවඟන හිතනවා මේ භික්ෂුවට තාමත් වැටහුනේ නෑ. කියල  නැවතත් ආරාධනා කරනවා
මේ විදිහට.....

## දෙවඟනගේ පෙලඹවීම.

මේ දෙවඟන බිමට බැහැල භික්ෂුවට කියනවා..

භික්ෂුව නුඹ තාම තරුණයි බලන්න කලු කෙස් තියෙන්නේ ඉතාම තරුන කාලේ මුල් වයසෙ ඉන්නෙ ඔබ තවම කාම ක්‍රීඩාව කරලත් නැහැ. මේ මිනිසුන් විසින් විදින මනුෂ්‍යමය වු කාමය භුක්ති විදින්න. මේ කාලෙකින් ලැබෙන්න තියෙන දෙයක් පස්සෙ යන්නෙ නැතිව දැන් විදින්න තියෙන කාමය විදින්න....

බලන්න මේ දෙවඟනගේ පෙලඹවීම. ඇයට ඕන කෙසේ හෝ මේ සමිද්ධි හාමුදුරුවන්ව ගිහි කාමයන්ට ඇදල දාන්න. මොකද ඇය දන්නේ නෑ වෙන ධර්මයක්. ඇය දන්න උතුම් කියල හිතා ඉන්න දේට තමයි ඇදල ගන්න හදන්නේ.
ඈ හිතන්නේ මේ හාමුදුරුවෝ දුකක් විදින්නේ කියලා.
කවුරුහරි කියල බලන්නකෝ මමත් මහන වෙන්න ආසයි කියලා ලැබෙන ප්‍රතිචාර කොහොමද කියල. එදාට තේරෙයි මේ දෙවඟන වෙනසක් නෑ කියල. මමත් පැවිදි උනේ අවුරුදු විසි පහෙන් නිසා මම හොඳට අහලා තියෙනවා. ඇත්තටම සංයුක්ත නිකායේ තියෙන මේ සමිද්ධි සූත්‍රය මට පැවිද්දට හිත හැරෙන්න බොහෝ උපකාරයක් උනා ඒකාලේ....

සමිද්ධි හාමුදුරුවෝ කියනවා...

දෙවුදුව... මම වර්ථමානයේ ලබන්න තියන දේ අතහැරලා අනාගතයේ ලබන දෙයක් පස්සේ දුවන්නේ නෑ. කාලයට අයිති දේ අතහැරල දාල කාලයට අයිති නැති දෙයකටයි මයන්සි වන්නෙ. තථාගතයාණන් වහන්සේ කියල තියෙන්නේ කාමයයි කාලයට අයිති. බොහෝ දුක් වලින් පිරුනු එකක්. .බොහෝ කායික මානසික වෙහෙසක් ඇති කරන එකක්. ආදීනව පිරුනු තැනක්. එහි භයමයි රැදිල තියෙන්නේ . නමුත් මේ මා හැසිරෙන ධර්මය එහෙම නෑ සන්දිට්ඨිකයි. අකාලිකයි ඒහිපස්සිකයි ඕපනයිකයි පච්චත්තංවෙදිතබ්බෝ විඤ්ඤෝහී කියන ගුණයන්ගෙන් යුක්තයි. කියලා ධර්මයේ ගුණ හයෙන් පහක් ගැන මෙතනදී සමිද්ධි හාමුදුරුවෝ කියනවා.

එවිට දෙවඟන නැවත අහනවා...

භික්ෂුව කොහොමද තථාගතයාණන් වහන්සේ කියන්නේ කාමයන් කාලයකට අයිතියි කියල. බොහෝ දුක් තියෙනවා කියල. උපායාස තියෙනවා කියලා භයානකයි කියලා ඊළඟට ධර්මය සන්දිට්ඨිකයි අකාලිකයි ඒහිපස්සිකයි ඕපනයිකයි කියල පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහී කියල

## අපි සරණ යන්නේ කුමන දහමක්ද.......

ධර්මය කියන වචයයේ තේරුම අපි හරියටම තේරුම් ගන්න ඕන. මොකද අපෙන් කවුරුහරි ඇහුවොත් ඔබ සරණ ගියේ කුමන ධර්මයක්ද කියල අපි ඒ අයට නිවැරදිව කියන්න ඕන. ඇත්තටම අපිසරණ ගිය ධර්මය කුමද්ද....

**පරියාප්තිය සහිත වු නවලෝකෝත්තර ධර්මයයි.**

පරියාප්තිය කියල කියන්නේ බුදු රජාණන්වහන්සේ බුද්ධත්වයට පත්වූ දවසේ පටන් පිරිනිවන් පාන දවස දක්වා දේශනා කල සූත්‍ර විනය අභිධර්මය ආදී ධර්මයයි.

නවලෝකොත්තර ධර්මය යනු

1. සොවාන් මාර්ගය
2. සෝවාන් ඵලය
3. සකදාගාමී මාර්ගය
4. සකදාගාමී ඵලය
5. අනාගාමී මාර්ගය
6. අනාගාමී ඵලය
7. අරිහත් මාර්ගය
8. අරිහත් ඵලය
9. නිර්වානය කියන ධර්ම නමයට

මෙම නවය තමයි අපට විශේෂයෙන් උපකාරයක් තියෙන්නෙ

සෝවාන් ඵලයට යමෙක් පත්වුනොත් එයා අනිවාර්යයෙන් ජීවිත හතක් ඇතුළත සසරින් නිදහස් වෙනවා. බලන්න මේක සසරටම පිහිටක් නොවේද කියල එහෙනම් අනෙක්වා ගැන කවර කථාවක්ද.

ඉතින් මේ මගට පිවිසෙන්න පරියාප්තිය නැතුව බෑ එක නිසා පරියාප්තිය කෙරෙහි සද්ධාව පිහිටුවා එයද සරණ යා යුතු වෙනවා. ඒත නිසා තමයි අපි පරියාප්තිය සහිතවූ නවලෝකොත්තර ධර්මය සරණ යන්නේ.

ඉතින් මේක ඔයාලා අද පටන් හොදින් මතකේ තියාගන්න ඕන

නමුත් මෙම දේශනාවේ සඳහන් වන්නේ මෙම නවලොකොත්තර ධර්මය බැවින් ස්වාක්ඛාත ගුණය අතහැරල තියෙන්නෙ මොකද ස්වාක්ඛාත ගුණය විශේෂයෙන් සඳහන් වෙන්නේ පරියාප්ති ධර්මය තුල නිසා

නමුත් අපි මේ සියළු ගුනයන් සැකෙවින් තොරා ගමු....

## ස්වාක්ඛාත වූ අමා දහම.......

මුල මැද අග මනාකොට දෙශනා කල නිසා ස්වාක්ඛාත

කියල කියනවා...

අර්ථ සම්පන්නව ව්‍යන්ජන සම්පන්ව පරිපූර්ණ පිරිසිදු නිවන්මග දේශනා කරපු නිසා ස්වාක්ඛාත කියල කියනවා.

අර්ථ සම්පන්නයි කියන්නේ නිර්වාණය ආදී ගැඹුරු දහමක් ඉලක්ක කරල තමයි සෑම වචනයක්ම දේශනා කරල තියෙන්නෙ.

සාමාන්‍යයෙන් අපි කථා කරන වචන ගත්තහම වචන කීයද වැදගත් වන්නේ. මාතෘකාවට අදාල වන්නේ  නමුත් තථාගතයාණන් වහන්සේ වදාල සියලු වචන අහක දාන්න එකක් නෑ. ඒ සියල්ල සත්වයාගේ යහපත උදෙසාමයි දේශනා කරල තියෙන්නේ . ඒක නිසා කියනවා අර්ථ සම්පන්නයි. කියලා .

ඒ ගැඹුරු අර්ථය සාමාන්‍ය අවුරුදු හතක කෙනෙකුටත් තේරෙන විදිහට උපමා උපමේය ගලපමින් සරල වචන වලින් ගැටපද නොතබා නොගැඹරු පද වලින් දේශනා

කරල තියෙනවා. මේක කරන්න පුළුවන් සම්මා සම්බුදු කෙනෙකුට විතරයි . පසේබුදු වරයෙකුටවත් බෑ මෙලෙස බෙදා දැක්වීමක් කරන්න. අදකාලේ බොහෝ දෙනෙක් තමන්ගේ පද වලින් දේශනා කරන්න ගිහින් නැතිනම් පාලි නොදැන. පද කඩන්න ගිහින් අවුල් කරගන්නෙ මේ හදුන්වාදීම සඳහා බුදුවරයෙක් අනන්ත සංසාරයක ඒ සඳහා විදපු දුක අමතකකර ය.

ව්‍යන්ජන සම්පන්නයි කියන්නේ මේ නොගැඹුරු පද වලින් දේශනා කිරීමයි.

පරිපූර්ණයි කියන්නේ ආයෙත් සීලයට මෙපමන තව එකතු කරන්න ඕන සමාධිය වඩන්න නම් තව මේ මේටික එකතු කර ගන්න ඕනෑ කියල හෝ විදර්ශනාව වඩන්න නම් තව මේ කාරනා අඩුයි කියල කරුනු සහිතව අඩුපාඩුවක් පෙන්වන්න තථාගතයාණන් වහන්සේ ඉතුරු කරල ඉඩක් තියල දෙශනා කරල නෑ...අන්න ඒ විදිහට පරිපූර්ණව දේශනා කරල තියන නිසා පරිපූර්ණයි කියනවා.

වැඩියි කියලා, අදට ගැලපෙන්නේ නෑ කියලා වෙනයම් කාරනාවක් කරුණු සහිතව දක්වලා දේශනාවේ කොටසක් අයින් කරන්න විදිහට තථාගතයාණන් වහන්සේ ධර්මය දේශනා කරල නැති නිසා පිරිසිදුයි කියනවා.

මෙන්න මේ විදිහට උන්වහන්සේ පෙන්වා දෙන්නේ නවලොකෝත්තර ධර්මයත් ඊට පැමිනෙන මාර්ගයත් පිළිබඳවයි. ඒක ඒ ධර්මය ස්වාක්ඛාතයි කියල කියනවා.

## සන්දිට්ඨික වෙයි සදහම්........

සන්දිඨික කියල කියන්නේ තමා විසින්ම අවබෝධ කලයුතු නිසා සන්දිඨික කියල කියනවා. සෑම සාසනයකම කියන්නේ තම සාතෘන් වහන්සේ කියන දේ ඒ විදිහටම පිළිගන්න කියන එකයි. කවදාවත් ඒ සීමා ඉක්මවා සිතන්න තහනම්
ඉක්මවා කටයුතු කලොත් දඬුවම් පවා නියම කරලා තියෙනවා. නමුත් තථාගත දහම ඊට හාත්පසින්ම වෙනස්.
තථාගතයාණන් වහන්සේ කියන දේ පිලිගන්න ඕන

ඒකට සද්ධාව කියනවා. සද්ධාවෙන් පිලිගෙන තමා විසින් ඒ මාවතේ ගමන් කරල අවබෝධ කරගන්න ඕන.

## අකාලික දහම් ගඟ.....

අකාලිකයි කියන්නෙ කාලයකට අයිති නැතිව විපාකය ඒ මොහොතේම ලැබෙන නිසා . යම් කර්මයක් කලවිට එහි විපාකය සඳහා කාලයක් තියෙනවා එය ..

දිට්ඨ ධම්මික....

සම්පරායික...

අපරාපරිය ... වශයෙන් වෙන්න පුළුවන් .

නමුත් රාගයක් ඇති කෙනෙකු ඒ මොහොතේ අසුභය වැඩුවොත් ඒ මොහොතේම රාගය දුරුවෙනවා. ඒක තව ටිකකින් වත් හෙට අනිද්දාවත් ඊළඟ ජීවිතේවත් වන දෙයක් නෙවෙයි. මේ මොහොතේ ම සිදුවන ක්‍රියා වලියක්..

ද්වේෂය ඇතිවිට මෛත්‍රිය ....

මේ දහමෙහි අකාලික භාවයයි.

## ඒහිපස්සිකකෝ කියල කියන්නේ...

ඇවිත් බලන්න කියල ඕනෑම කෙනෙක්ව යොමු කරන්න පුළුවන් මොකද ඕනෑම තරාතිරමක කෙනෙකුට මේ තුල සරණක් තියනවා. පිහිටක් තියෙනවා ..

නිතර තරහගන්න කෙනෙක් ඉන්නවනම් බලෙන් හරි කිවුවොත් මෛත්‍රිය වඩන්න කියලා අන්න ඒකෙනා ඒක කලොත් එයාගේ තරහ එතන පිහිටන්නේ නැති වෙලා යනවා. කෙහේ හරි අසූචි ගොඩක් තියෙනවානම් කෙනෙක්ව එක්කන් ගිහින් පෙන්නන්න සුදුසු නෑ. මොකද එය දැක්ක කෙනාට එය අප්‍රියයි. නමුත් වටිනා මැණිකක් ඇතිවිට එක්කන්

ගිහින් පෙන්වීම වටිනවා මොකද සෑම කෙනාම එහි වටිනාකම තේරෙනවා. අන්න ඒ වගේ සම්පූර්ණයෙන් සත්‍ය වූ වටිනාකමක් ඇති මේ සද්ධර්මයට කෙනෙකු ඇද දැමීමට සුදුසු නිසා ඒහිපස්සික කියල කියනවා.

## ඕපනයික කියල කියන්නේ ...

සිතට පමුණුවා ගතයුතු සිතෙහි උපදවා ගතයුතු නිස ඕපනයික කියනවා ගිණිගත් හිසක් ඇති කෙනෙක් ඒ ගින්න නිවන්න මහන්සි ගන්නවාට වැඩියෙන් මහන්සි ගතයුතු යමක් තියෙනවානම් ඒ සෝවාන් ආදී මාර්ග ඵල ධර්මයන්ය. සංසාරයේ මෙච්චර දුරක් අපි ආවේ මිනිසුන් වෙලාම නොවෙයි . තිරිසන් ආදී සතර අපාය අපේ මහ ගෙදර උනා තව යනවනම් මේ මහගෙදර තමයි නිතර හමුවන්නේ. පිනක් මතුවන කාලයේදී තමයි මනුස්සයෙක් වෙන්නේ. පිහිටක් හදාගන්න පුළුවන් වන්නේ. ඒත් බුද්ධ ශාසනයක් තිබුනොත් විතරයි. අන්න ඒක නිසා තමයි සතර අපායෙන්වත් නිදහස් වීම පිණිස මේ දහම තමා තුලටපමුණුවාගත යුතු වන්නේ.....

## පච්චත්තංවෙදිතබ්බො විඤ්ඤූහී ගුණ හිමි ණුවණැත්තන්ගේ දහම.....

නුවන ඇති අයට විතරක් අවබෝධ කල හැක්කක් මේක. සංසාර දුක දකින්න බැරි කාම වස්තූන් කෙරෙහිම ඇලිලා ඉන්න එයම සාරය කරගත්ත දෙව් මිනිසුන්ගේ සිත් වලට මේ ධර්මය වැටෙන්නේ නෑ. සසරින් ගෙනාපු ණුවනක් නැති පොතේ දැනුම විතරක් ඇති උගතුන්ටද මේ දහම වටින්නේ නෑ. මෙ දහම දකින්න පුළුවන් දුක දන්න කෙනාට. දුක දුක් වසයෙන් සිතන්න පුළුවන් කෙනාට . ඒ දුකින් මිදෙන්න ඕන කියල නිවැරදිව සිතන කෙනාට. බෙදල බලන්න පුළුවන් කෙනාට. එක පැත්තක් විතරක් බලන්නේ නැතිව හාත්පසින්ම බලන්න පුළුවන් කෙනාට.

උග්ඝටිතඤ්ඤූ විපටිතඤ්ඤු නෙය්‍ය කියන උසස් පුද්ගලයින්ට.....

මේ අපි විස්තර කලේ ධර්මයේ ගුණ ඉතාම කෙටියෙන්.
දැන්. ඔබට තේරෙනවා නේද මෙ ධර්මය අකාලික වෙන්නෙ කොහොමද.. කාමය කාලික වෙන්නේ කොහොමද කියලා. කාමය කියන්නේ බොහෝ බැඳීම් ඇතිකරන දෙයක් හ් නිසා අඬන්න වැලපෙන්න සුසුම්හෙලන්න වෙනවා. අද දවසේ පුවත් විස්තර ඇස්වත් කාමයන් නිසා සිදුවුන අපරාධ කොපමනක්ද. නමුත් මේ නිවන් මග යන්නන්ට එවැනි විපතක්නෑ. හරිම  පිරිසිදුයි අනෙක් අයටත් අභය දානයමයි ලැබෙන්නේ එවැනි පුද්ගලයෙකුගෙන්. එක නිසා කියනවා කමයෝ බෙ◌ිහෝ දුක් සහිතයි කියලා

නමුත් මේක ඒ දෙවඟනට තේරුනේ නෑ. ඒකයි දෙවඟන ඇහුවේ....භික්ෂුව කොහොමද තථාගතයාණන් වහන්සේ කියන්නේ කාමයන් කාලයකට අයිතියි කියල. බොහෝ දුක් තියෙනවා කියල. උපායාස තියෙනවා කියලා භයානකයි කියලා  ඊළඟට ධර්මය සන්දිඨිකයි අකාලිකයි ඒහිපස්සිකයි ඕපනයිකයි කියල පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහී කියල

## දෙවුදුව තේරුම් ගණීද මේ ගුණ.....

සමිද්ධි තෙරුන් කියනවා......
දෙවුදුව මම පැවිදිවෙලා තාම එච්චර කාලයක් නෑ. මට ඔච්චරයි කියන්න පුළුවන් . අන්න තථාගථයන් වහන්සේ ඉන්නවා තපොදාරාමයේ යන්න ගිහින් උන්වහන්සේගෙන්ම අහන්න එවිට ඔබට පහදා දේවි.. කියලා කිවුවා.

දෙව්දුව නැවත කියනවා..

භික්ෂුව මට ඒ තථාගතයාණන් වහන්සේ ලගට යන එක පහසු නෑ. මම ඉතාම අල්පෙසාක්‍ය දෙවඟනක් සෑම මොහොතකම මහේසාක්‍ය දෙව්වරුන් බුදු

රජාණන්වහන්සේගේ අසල සිටිනවා. ඒක නිසා ඔබම යන්න ගිහින් ප්‍රශ්නය අසන්න මමත් එන්නම් කියල කිවුවා ඉතින් මේ විදිහට කථාකරගෙන අර දෙවිදූ යන්නගියා...

සමිද්ධි ස්වාමීන් වහන්සේ පසුව බුදුරජාණන් වහන්සේ හමුවන්නට ගියා. ගිහින් උදෑසන සිදුවූ සියළු විස්තරය තථාගතයාණන් වහන්සේ සමග කිවුවා . ඊළඟට කියනවා ස්වාමීනි ඒ දෙවඟන ඇත්ත කියන කෙනෙක් නම් දැන් ඇවිල්ලා ඇති මෙතනට

අන්න ඒ වෙලාවේ ඈත ඉදන් ඒ දෙවඟන කියනවා අහන්න භික්ෂුව අහන්න මම ඇවිල්ලා ඉන්නෙ  කියල.

ඒ වෙලාවෙ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා
ඉතාම ගැඹුරු ගාථා පෙලකින් රහතන් වහසේලා ගැනත් නිවන ගැනත් වදාල මුල් ගාථා වලින් එතුමියට තේරුනේ නෑ
අවසානයේ තේරුම් ගත්තා එතුමිය සිතාගෙන හිටියා වගේ ලාමක දෙයක් උදෙසා නෙහෙයි මේ පැවිදිවෙලා ඉන්නේ කියලා. එතුමිය තේරුම් ගත්තා ධර්මයේ තිබෙන ගාම්භීරත්වය.

සංගාමජි